# කලු දොදොල්

**වුවමනා දේවල් :—**

පොල් ගෙඩි 3 යි
හාල් හුණ්ඩු 1 ක පිටි
හකුරු රා. 2 යි
උණුවතුර පයින්ට් 6 යි.

**සාදන ක්‍රමය :—**

හොඳ පොල් ගෙඩි තුනක පොල් ගාගෙන උණුවතුර පයින්ට් 6 වරින් වර දමා කිරි මිරිකා වෙන් කර ගන්න. එම පොල් කිරි වලට සිහින්ව ගාගත් හකුරු හා හාල් පිටි ද මිශ්‍ර කර යකඩ තාච්චියකට දමා ලිප තබා නො නවත්වා හැඳිගාන්න. (යකඩ හැන්දක් නම් වඩා හොඳය). පැය දෙකක් පමණ හැඳිගාන විට මිශ්‍රනය ක්‍රමයෙන් උකුවීමට පටන් ගනී. උකු වන මිශ්‍රනයට සතුටුනම් ශුද්ධ කර කැබලි වලට කපාගත් කජු මද දැමිය හැකියි. කලු දොදොල් සෑදීගෙන එනවිට මතුවන තෙල් වරින් වර හැන්දෙන් ඉවත් කල යුතුයි. පදමට උකුවූ විට ලිපෙන් බා පැතැලි දීසියක හෝ බන්දේසියක තුනීකර නිවුන පසු කෑලි වලට කපාගන්න.

ගොවිකම් සඟරාව